## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර )-2019

2025 - ජූලි

**BCOM E 2025 - සංවිධාන චර්යා**

ප්‍රශ්න සංඛ්‍යාව : (හයයි) 06

ප්‍රශ්න පහකට (05) කට පිළිතුරු සපයන්න. කාලය : පැය 03 යි

---

**ප්‍රශ්න අංක 01**

අ. "සංවිධාන චර්යාව" නිර්වචනය කර එහි අන්තර්ගත විෂය ස්වභාවය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. "මනෝවිද්‍යාව, සමාජ විද්‍යාව, මානව විද්‍යාව, ආර්ථික විද්‍යාව හෝ කළමනාකරණය වැනි අවම වශයෙන් විවිධ අධ්‍යයන ක්ෂේත්‍ර තුනකින් සංවිධානාත්මක හැසිරීම වර්ධනය වන ආකාරය සාකච්ඡා කරන්න, සහ එක් එක් ක්ෂේත්‍රය සේවා ස්ථානයේ හැසිරීමට දායක වන ආකාරය පිළිබඳ නිශ්චිත උදාහරණ සපයන්න."

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ. සංවිධාන චර්යාව සන්දර්භය තුළ සංජානනය නිර්වචනය කර සේවා ස්ථාන සැකසුම් තුළ එහි වැදගත්කම සාකච්ඡා කරන්න..

(ලකුණු 06)

ආ. පුද්ගල මනෝවිද්‍යාව සහ සංවිධාන චර්යාව අතර සම්බන්ධය අදාළ උදාහරණ සමඟ සාකච්ඡා කරන්න.

(ලකුණු 14)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ. පෞරුෂය නිර්වචනය කර පුද්ගල පෞරුෂ ලක්ෂණ සේවක කාර්ය සාධනයට සහ සේවා ස්ථාන සබඳතාවලට බලපාන ආකාරය විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10)

ආ. සේවා ස්ථානයේ බලයේ ප්‍රධාන මූලාශ්‍ර මොනවාද? කළමනාකරණ තත්වයන් තුළ එක් එක් වර්ගය ඵලදායී ලෙස භාවිතා කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

අ. සංවිධාන තුළ ගැටුම් පිළිබඳ සංකල්පය පැහැදිලි කර ආයතනික කාර්යක්ෂමතාව සඳහා එහි ධනාත්මක සහ ඍණාත්මක ප්‍රතිවිපාක දෙකම පරීක්ෂා කරන්න.

(ලකුණු 10)

ආ. සංවිධාන චර්යාව තුළ සාකච්ඡා (negotiations) යනු කුමක්ද? විවිධ සාකච්ඡා විලාසයන් වර්ගීකරණය කර සේවා ස්ථාන අවස්ථා වලදී ඒවා යොදන ආකාරය විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

අ. සංවිධාන චර්යාව තුළ තීරණ ගැනීම යනු කුමක්ද? තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහ සේවා ස්ථානයේ ඵලදායී තීරණ වලට බලපාන සාධක සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ. විවිධ සන්නිවේදන ක්‍රම (විධිමත් එදිරිව අවිධිමත්) සේවක අභිප්‍රේරණ මට්ටම්වලට බලපාන ආකාරය සංසන්දනය කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 06**

පහත සඳහන් දේ සඳහා කෙටියෙන් පිළිතුරු ලියන්න

අ. පංච මහා පෞරුෂය න්‍යාය (Big Five Personality)

ආ. කණ්ඩායම සහ සමූහය

ඇ. රැකියා තෘප්තිය

ඈ. ආයතනික සංස්කෘතිය

ඉ. කාර්යාලීය දේශපාලනය

**(ලකුණු 4X5)**
**( මුළු ලකුණු 20)**